
ලංකාදීප
2019/12/28
පිටු අංක 01, 06

# ආර්ථික වර්ධන වේගය සියයට 4ට වැඩි කරනවා: උද්ධමනය 4 ට පහළින් තියනවා

## මහ බැංකු අධිපති



(හර්ෂණ තුෂාර සිල්වා)

ලබන වසරේ දී ආර්ථික වර්ධන වේගය සියයට 4ත් 4.5ත් අගයක් දක්වා ඉහළ නැංවීමටත් උද්ධමනය සියයට 4කට අඩු අගයක පවත්වා ගැනීමටත් බලාපොරොත්තු වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා ඊයේ (27) පැවැසීය.

6 වැනි පිටුවට

## ආර්ථික වර්ධන වේගය සීයට 4ට වැඩි කරනවා: උද්ධමනය 4 ට පහළින් තියනවා

1 පිටුවෙන්...

2020 වසරෙන් පසුව අවශ්‍ය ප්‍රතිසංස්කරණ කරමින් වාර්ෂික ආර්ථික වර්ධන වේගය සියයට 6.5කට වඩා ඉහළ නැංවීමටත් උද්ධමනය සියයට 4ත් 6ත් අතර අගයක පවත්වා ගැනීමටත් බලාපොරොත්තු වන බව ඔහු සඳහන් කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඊයේ පැවැති මුදල් ප්‍රතිපත්ති විවරණය කිරීමේ මාධ්‍ය හමුවට එක්වෙමින් මහාචාර්ය ලක්ෂ්මන් මහතා එම කරුණු සඳහන් කළේය.

බාහිර මූල්‍ය අංශය ගත්විට අපනයන කාර්යසාධනය ඇත්තේ ඉතාම දුර්වල මට්ටමක යැයි පැවැසූ මහාචාර්ය ලක්ෂ්මන් මහතා ඉතා විශාල වෙළෙඳ හිඟයන්, දිගින් දිගටම පවතින ජංගම ගිණුමේ හිඟය, ප්‍රමාණවත් පරිදි සෘජු විදෙස් ආයෝජන නොලැබීම සහ ඊට විකල්ප නොමැතිකම නිසා ණය මත යැපීමට සිදුවීම විදෙස් මූල්‍ය අංශයේ තිබෙන අනෙකුත් ගැටලු යැයි ද කීවේය.

රටට විශාල වශයෙන් විදෙස් මූල්‍ය අවශ්‍ය කර ඇති බව කී හෙතෙම ගෝලීය ආර්ථිකය සහ මූල්‍ය වෙළෙඳපොළවල් කෙරෙහි අවධානයෙන් සිටීම අවශ්‍ය යැයි ද පැවැසීය.

මෙම තත්ත්වය මත අන්තර්ජාතික මූල්‍ය අරමුදල වගේම අනෙකුත් බහුපාර්ශ්වීය ආයතන සමඟ වැඩ කිරීමට බලාපොරොත්තු වන බවත් එම ආයතන සමඟ කටයුතු කරන්නේ ජාතික ප්‍රතිපත්තිය තුළ රැඳී සිටිමින් රට තිරසර මාර්ගයට ගෙන යාම සඳහා බවත් ඔහු කීය.

රාජ්‍ය මූල්‍ය ඒකග්‍රතාව පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව ගැන ආණ්ඩුව අවධානයෙන් සිටින බව කී හෙතෙම, ආර්ථිකය තුළ නව පිබිදීමක් ඇති කිරීමට සහාය දෙන අතරවාරයේ දී මූල්‍ය ක්ෂේත්‍රයේ දීර්ඝකාලීන ගැටලුවලට විසඳුම් සෙවීම සම්බන්ධයෙන් ද ආණ්ඩුවේ අවධානය යොමු කර ඇතැයි වැඩිදුරටත් පැවැසීය.

ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවත්වා ගැනීමට මහ බැංකුව තීරණය කළ බව ද ඒ අනුව ප්‍රතිපත්ති පොලී අනුපාත දැනට පවතින මට්ටමේ පවත්වා ගනිමින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඉදිරියටත් පවත්වාගෙන යන බව ද ශ්‍රී ලංකා මහ බැංකුව දැනුම් දුන්නේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් මහ බැංකු පරිශ්‍රයේ පැවැති මාධ්‍ය හමුවක දී ඒ බව දැනුම් දෙන ලද අතර එය මහාචාර්ය ලක්ෂ්මන් මහතාගේ ප්‍රධානත්වයෙන් මුදල් ප්‍රතිපත්ති විවරණය දැනුම් දීම සඳහා පැවැති පළමු මාධ්‍ය හමුව ද විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය දෙසැම්බර් 26 වැනිදා රැස්වී මේ බව තීරණය කර තිබෙන අතර ඒ අනුව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7ක් ලෙසත් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8ක් ලෙසත් පවත්වාගෙන යෑමට තීරණය කර තිබේ. එමෙන්ම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 5ක අගයක පවත්වාගෙන යෑමට ද මුදල් මණ්ඩලය තීරණය කර ඇත.

දේශීය ආර්ථිකයේ පවතින තත්ත්වය සහ අපේක්ෂිත තත්ත්වය, මූල්‍ය වෙළෙඳපොළේ මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය මෙම තීරණය ගෙන ඇති බව ද ශ්‍රී ලංකා මහ බැංකුව සඳහන් කළේය.